# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2204/17 - 2020 දෙසැම්බර් මස 02 වැනි බදාදා - 2020.12.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

මධ්‍යම පළාතේ ගරු ආණ්ඩුකාරතුමන්ගේ නිවේදනය

**1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු සංශෝධිත මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරිය) 277(1)(i), 277(1ආ)(ආ) වගන්ති යටතේ කරනු ලබන නියමය**

මාතලේ මහා නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපති ඇතුළු මන්ත්‍රීවරු පිරිසක් විසින් නගරාධිපති ඩල්ජිත් නන්දලාල් අළුවිහාරේ මහතාට එරෙහිව ඉදිරිපත් කරන ලද පැමිණිල්ලේ චෝදනා සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා, ඔහු විසින් මාතලේ මහා නගර සභාවේ නගරාධිපතිවරයා වශයෙන් සංශෝධිත මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරිය) 277(1) වගන්තියේ සඳහන් වැරදි කිසිවක් සිදු කොට ඇත්තේද යන්න, මාස 03ක කාලයක් තුළ වාර්තා කිරීම සඳහා මා විසින් අංක 2190/24 හා 2020.08.25 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් පත් කරන ලද ඒක පුද්ගල පරීක්ෂණ කොමිෂන් සභාව විසින් පරීක්ෂණයක් සිදු කර පැමිණිල්ලේ සහ වගඋත්තරකරුගේ සාක්ෂි, ලේඛණ සහ ලිඛිත සැළකිරීම් සලකා බැලීමෙන් අනතුරුව සිය නිරීක්ෂණ හා නිගමන සහිතව මා වෙත භාර දී ඇති 2020.11.24 දිනැති අවසන් වාර්තාව ප්‍රකාරව,

ඩල්ජිත් නන්දලාල් අළුවිහාරේ මහතා, මාතලේ මහා නගර සභාවේ නගරාධිපතිවරයා වශයෙන් එකී ධූරයේ කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීමේ දී, සංශෝධිත මහා නගර සභා අඥාපනතේ (252 අධිකාරිය) 277(1)(අ), (ඇ), (ඈ) සහ (ඉ) වගන්තිවල සඳහන් වැරදි සිදු කර ඇති බවට ප්‍රමාණවත් සාක්ෂි ඇති බවට මා සෑහීමට පත්වූ හෙයින්,

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු සංශෝධිත මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරිය) 277(1)(i) සහ 277 (1ආ) (ආ) වගන්ති යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර නීතිඥ ලලිත් යූ. ගමගේ වන මම මාතලේ මහා නගර සභාවේ නගරාධිපති ඩල්ජිත් නන්දලාල් අළුවිහාරේ මහතා 2020.12.02 දින සිට මාතලේ මහා නගර සභාවේ නගරාධිපති ධූරයෙන් පහ කරමි.


1A - PG 5174 — 25 (2020/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

තව ද, විවිධ පනත් මගින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමට මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්වරයාට හා මාතලේ මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයාට මෙයින් නියම කරමි.

**නීතිඥ ලලිත් යූ. ගමගේ,**
ආණ්ඩුකාරවර,
මධ්‍යම පළාත.

2020 දෙසැම්බර් මස 02 වැනි දින.

12-302

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.